# රටක් බිලිගත්, ලොවක් හැඬවූ, සයුර…අද ඔබ නිහඬද?

සිරිලක  ඉතාම රමණීය දිවයිනකි.
ජලයෙන් වටවී තිබෙන අපේ රටට ලැබුණේ
විදේශිකයන්ගේ නොමද ආකර්ශණයකි.
ලංකාව සුන්දර වුවේද සයුරේ ඇති
අති සොඳුරු බව නිසාය.
දෙශිය හෝ විදේශිය, ඒ කිසිවෙක්
ඒ සුන්දර මුහුද වෙත යෑමට බිය වුවේ නැත.
අපි ඒ සුන්දරත්වය විඳ ගැනිමට නොමදව එහි ගියෙමු.
එහෙත් සයුරෙ රළ මෙතරම් දරුණු වේයැයි කිසිවෙක් සිතුවේද?
චංචල වූ සිත් නිවා ගැනිමට බොහෝ දෙනෙක් එහි ගිය වාර අනන්තයි.
ළමාවියේ අසිරිය විඳ ගන්නට,ඉරිදා දවසකට පවුලම එක් වන්නට
මෙය කදිම තොතැන්නක් වූ බව නෝඅනුමානයි.
මධ්‍යවෙදින්, මධ්‍යවෙදිනියන්,කවියන්, කිවිඳියන්,
තම පත්‍රයට උසස් ගණයේ ප්‍රේක්ෂක ප්‍රතිචාර ඇති
නිර්මාණයක් කිරිම සඳහා මෙහි ගියේ ඉමහත් ආස්වාදයකිනි.
කුඩා දරුවන්, යෞවන, යෞවනියන්, බාල මහලු අපි කවුරුත්
ඒ චමත්කාර දසුන දැක ගැනිමට කිසිඳු පැකිලිමක් දැක්වුවේ නැත.





සයුරේ රළ පාගන්නට ඇත් නම් කෙතරම් අගේ දැයි
අපට සිතුණු වාර අනන්තයි අප්‍රමාණයි.
එහෙත් අපේ ඒ සොඳුරු බලාපොරොත්තු රළ පෙළටම
ගසාගෙන ගියේ ලෝක ඉතිහාසයේ, හතලිස් වසරකට
නොවුණු දරුණුතම ඛේදවාචකය අපට උරුම කරමිනි.
එදා අප සැනසු සයුර, අද අපට කඳුලු ගංගාවක් උරුම කර දී ඇත.
වටිනා ජීවිත දස දහස් ගනන් බිලිගත් ඒ දැඩි රළ පෙළ, අද නිහඬය…



ලොවක්ම හඬවන්නට, මෙතරම් ඔබ කුරිරුවන්නට, අප ඔබට කළ වරද කිමෙක්ද?

දිලිනි ජයසිංහ-2005/02